**අතුරලිය ප්‍රාදේශීය සභාව**
**<u>මාතර දිස්ත්‍රික්කය</u>.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 09 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට **අතුරලිය** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | විවිධ ගැලපීම් කිරීමේදී සමුච්චිත අරමුදලට රු. 4,267,729 ක මුදලක් අඩුවෙන් බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් හා වියදම් ගිණුමේ ඌණතාවය රු.2,099,448 ක් වුවද අධිකතා ඌනතා ගිණුමට එය රු.2,168,998 ක් ලෙස ගැලපීමෙන් රු.69,550 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (iii) | 2020 වර්ෂයේ ආයුර්වේද මධ්‍යස්ථානය කාමර වෙන් කිරීම සඳහා දරන ලද රු.350,000 ක වියදම සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සභාව සතු මාළු වෙළඳපොල සංවර්ධනය කිරීමට අවස්ථා කීපයකදී මිලදී ගෙන තිබූ රු. 88,850 ක්වූ උපකරණවල වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රාග්ධනිත කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ රු.187,348ක් වූ බලපත්‍ර ගාස්තු බිල්කල ආදායම, ආදායම් හා වියදම් ගිණුමේ රු. 118,998 ක් ලෙස දැක්වීමෙන් වර්ෂයේ ආදායම රු. 68,350 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (vi) | රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව විසින් මුද්දර උපලේඛන පිළියෙල කිරීමේ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 2,949,120 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව රු. 7,446,880 ක් ලෙස දැක්වීමෙන් වර්ෂයේ ආදායම රු.4,497,760 වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 7,210,616 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 133,947 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අසමාන වූ ශේෂ පිළිබඳ හඳුනාගෙන නිවැරදි කිරිමට කටයුතු කරමි |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.148,365,922 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 146 වගන්තිය | 2012 වර්ෂයේ වරිපනම් කාර්යය සඳහා දේපළ තක්සේරුවෙන් පසු නැවත තක්සේරුවක් සිදුකර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතු යුතුවේ. | වරිපනම් බදු පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුවක් මේ වන විට සකස් කර ඇත. |
| | (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ගිණුම් සමඟ ඉදිරිපත් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------ | | | |
| (i) මු.රෙ.571 | කල් ඉකුත් වූ රු.1,592,920 ක් වටිනා තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ii) මු.රෙ.1646 | සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 07 ක් සම්බන්ධයෙන් ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී වාහන වල ධාවන සටහන් හා මාසික සාරාංශ ක්‍රමානුකූලව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**
**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**
**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.172,717 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,058,865 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,717,000 | 1,308,494 | 1,056,993 | 1,418,991 | 1,798,500 | 1,267,457 | 1,206,899 | 1,167,490 |
| කුලී | 2,185,000 | 3,116,696 | 3,049,972 | 70,410 | 3,985,000 | 1,363,365 | 1,377,217 | 3,686 |
| බලපත්‍ර ගාස්තු | 223,500 | 159,684 | 128,214 | 33,470 | 243,100 | 255,146 | 254,231 | 2,000 |
| වෙනත් ආදායම් | 9,057,000 | 8,830,389 | 3,493,129 | 21,291,332 | 5,950.000 | 9,522,903 | 581,413 | 15,954,072 |
| එකතුව | 13,182,500 | 13,415,263 | 7,728,308 | 22,814,203 | 11,976,600 | 12,408,871 | 3,419,760 | 17,127,248 |

**2.2.2 වරිපනම් හා බදු**

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,118,930 ක් වූ අතර, රු.662,135 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සහ අධි ගාස්තු සමඟ රු.1,781,065 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.412,185 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,138,880 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ක්ෂේත්‍රයට ගොස් දැනුවත් කිරීම හා රටේ අයහපත් තත්ත්වය හේතුවෙන් ජංගම සේවය පැවැත්වීමට නොහැකි විය. |
| **(ආ)** ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.44,960 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.12,395 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.7,244 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.50,111 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ගොවිජන සේවා කොමසාරිස් දෙපාර්තමේන්තුවට අක්කරබදු ගෙවීම් කිරීම හා දේපල අයිතිකරුවන් නිවැරදිව හඳුනාගත නොහැකි විය. |

**2.2.3 වෙනත් ආදායම්**

-------------------

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.526,700 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.20,732,306 ක මුදලක් අය විය යුතුව තිබුණි. | හිඟ මුදල් කඩිනමින් අය කරගත යුතුවේ. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පැවති සාකච්ඡාවෙන් පසු උසාවි දඩ මුදල් අඛණ්ඩව ලැබෙමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්ය සාධනය**

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ක්‍රියාකාරී සැලැස්ම** | | |
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් සියල්ල වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 ජනවාරි මස පැවැත් වූ මහා සභාවේ දී අනුමත කර ඇත. |
| **(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කසළ බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර දිනකට එක් රැස් කරන ටොන් 02 ක පමණ කසළ ප්‍රමාණය අවිධිමත් ලෙස ගොඩපිටියේ පෞද්ගලික ඉඩමකට බැහැර කරමින් තිබුණි. | විධිමත් ලෙස කසළ බැහැර කළ යුතු වේ. | ඉඩමක් නොමැති බැවින් පෞද්ගලික ඉඩමකට කසල බැහැර කර සතියකට වරක් පස් යොදා වැසීම කරනු ලැබේ. |
| **(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක** | | |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමට වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. | 2020 අයවැය තුළින් විස්තරාත්මකව එළිදැක්වීම සඳහා සැලසුම් සකස් කිරීමට ප්‍රතිපාදන වෙන්කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අනාවරණය වී තිබූ අනවසර ඉදිකිරීම් 27 කින් 20 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් පරීක්ෂා කර විධිමත් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී නීත්‍යානුකූලව කටයුතු කරමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 05 ක් සම්පූර්ණ කර ගැනීමට හා 02 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළයුතු වේ. | පුරප්පාඩු තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසු බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (ii) | බඳවාගෙන තිබූ සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන්ට නියමිත රාජකාරී නොපැවරීම හේතුවෙන් අදේශක පදනම මත නැවත සේවකයින් බඳවා ගැනීම නිසා සභාවට සමාලෝචිත වර්ෂය සඳහා රු.1,919,921 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. | බඳවා ගත් තනතුරු වලට අදාළව රාජකාරී පැවරීම කළ යුතුවේ. | රාජකාරි කටයුතු පැවරීම දේශපාලන අධිකාරිය විසින් සිදු කරනු ලබයි. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු බැකෝ යන්ත්‍රය සංවර්ධන කටයුතු වෙනුවෙන් යෙදීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.580,188 ක ඉන්ධන වියදමක් දරා මීටර් පැය 941.4 ක් සේවයේ යොදවා තිබූ නමුත් ඉටු කිරීමට නියමිත වැඩ කොටස් සම්බන්ධව ඇස්තමේන්තු හා නිමිවැඩ වාර්තා සකස් කර නොතිබුණි. | ඉටු කිරීමට නියමිත වැඩ කොටස් සම්බන්ධව ඇස්තමේන්තු හා නිමිවැඩ වාර්තා සකස් කළ යුතුවේ. | සභාපතිගේ උපදෙස් අනුව සේවයේ යොදවා ඇත. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනවසරයෙන් පරිහරණය කරමින් පැවති සභාව සතු අක්කර 02 රූඩ් 02 පර්චස් 39 ක් වූ ඉඩම 03 ක් සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි . | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුවේ. | ඉදිරියේ දී කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු ඉඩම් 13 කට අදාලව ඔප්පු හා පිඹුරුපත් ද නොතිබුණි . | ඉඩම් සඳහා ඔප්පු හා පිඹුරුපත් සකස් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී කටයුතු කරන බව. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

**----------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ----------------------------- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව විසින් පරිහරණය කරනු ලබන අක්කර 05 රූඩ් 02 පර්චස් 06 ක්වූ ඉඩම් 05 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිහරණය කරන සියළුම ඉඩම් සභාවට පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | පවරා ගැනීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**----------------------------------------**

**4.1 අභ්‍යන්තර විගණනය**

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | -------------- | ---------------------------- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් කළ යුතු වේ. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ඉදිරියේදී සිදු කරමි. |